# ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ බෞද්ධ අනන්‍යතාවය

උදා හෙට්ටිගේ

## හැඳින්වීම

පෙරදිග හා අපරදිග ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන පුරාණ චිත්‍ර සාධක අපට හමුවන්නේ ප්‍රාග් ඓතිහාසික යුගවල පටන්මය. ඒ අතරින් අපරදිග කලාපීය රටවල චිත්‍ර පෙරදිග රටවලට වඩා දියුණු ලක්ෂණ පෙන්නුම් කරයි. ඇල්ටමීරා හා ලැස්කෝ චිත්‍ර සටහන් ඊට නිදසුන් සපයයි. ඉන්දියානු ගුහා සිතුවම් තුළින් ආසියානු කලාපීය රටවල මුල් කාලීන කලාව කෙරෙහි නිදසුන් සපයා ගැනීම දුෂ්කර නොවේ. මධ්‍ය ඉන්දියාව පෙරටු කොටගෙන උතුරු හා නැගෙනහිර කලාප මෙන්ම සෙසු කලාපීය රටවල ද මෙවැනි චිත්‍ර දක්නට ලැබීම අපට වැදගත් වේ. ශ්‍රී ලාංකීය ප්‍රාථමික ගුහා සිතුවම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී දැනට අනාවරණය වී ඇති ස්ථාන සමූහය තුළ ඒකාග්‍රතාවයක් දක්නට ලැබේ. අන්තර්ගතය, ශෛලිය, වර්ණ, ශිල්ප ක්‍රමය, නිර්මාණශීලීත්වය ආදී සියලු අංගවල මෙකී ලක්ෂණ හඳුනා ගත හැකිය. සත්ත්ව ආකෘති පෙරටු කරගත් මානව රූප, ඇඳහිලි ආකෘති සහ වෙනත් සංකේත ආශ්‍රයෙහි නිර්මිත ශ්‍රී ලාංකීය ගුහා චිත්‍රවල අන්තර්ගතය බොහෝ විට කේවල හා යුගල රූප වලට පමණක් සීමා වීම විශේෂය.

සාමූහික සංසිද්ධි මේ තුළ චිත්‍රණය නොවීමේ ලක්ෂණ විශේෂ වේ. මෙම චිත්‍ර බොහෝ විට ස්වාභාවික ලෙන් පදනම් කොටගෙන දක්නට ලබේ. ප්‍රාග් ඓතිහාසික ජන කණ්ඩායම් ආශ්‍රයේ වූ ජනාවාස භූමි පෙරටු කොටගෙන මෙම චිත්‍ර හමුවේ.

අනුරාධපුර යුගයේ මුල් භාගයේ හමුවන සීගිරි බටහිර ලෙන් චිත්‍ර කාන්තා රූප වලට පමණක් සීමා වූ සුවිශේෂී චිත්‍ර නිදර්ශනයන්ය.

ලාංකීය චිත්‍රකරණයේ සංසිද්ධීන් අතර ප්‍රධානතම ස්ථානයක් වන සීගිරි චිත්‍රවල ලෞකිකත්වය පෙරදැරි කොට ඇති ලක්ෂණය මත අන්තර්ගතය හා නිර්මාණ ස්ථානයෙහි බෞද්ධාගමික පසුබිමක් දක්නට නොලැබේ.

ඉන්පසු ලාංකීය චිත්‍ර ඉතිහාසයේ හමුවන බොහෝ නිදර්ශන ස්ථානීය සුවිශේෂත්වය හා අන්තර්ගතය අනුව බෞද්ධාගමික පසුබිමක් මත නිර්මාණය වූ ඒවා බව පෙනේ. වාහල්කඩ, ධාතුගර්භ, ලෙන්, ගිරි විහාර, ලෙන් විහාර ආදී වශයෙන් ස්ථාන ගණනාවක් හඳුනා ගැනීමට හැකිවේ. ශ්‍රී ලංකාවේ හමුවන සිතුවම් නිදර්ශන අතර කතෝලික චිත්‍ර හා මුස්ලිම් පල්ලි ආශ්‍රිත චිත්‍ර හැර බෞද්ධ චිත්‍ර ස්ථාන ගණනාවක් හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

බුදුසමය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියෙහි දායාදයන් වශයෙන් චිත්‍ර කලාව ද ලොව බොහෝ රටවලට ව්‍යාප්ත වූ බව දක්නට හැකිය. ඉන්දියාව කේන්ද්‍ර කරගනිමින් පෝෂණය වූ බෞද්ධ සමාජයන් ඈත පෙරදිග රටවලට ද ව්‍යාප්ත වූ බවක් දක්නට ලැබේ: බුදුසමය ඇරඹූ ධර්ම ප්‍රචාරක කටයුතු විශේෂයෙන්ම මෙයට හේතු වූ බව පෙනේ. ථෙරවාදී හා මහායාන බුදුසමය පෙරදිග රටවල් කරා ව්‍යාප්ත වනවාත් සමඟම බෞද්ධ සංස්කෘතික සාහිත්‍යය ද පෝෂණය විය. මේ සමඟම බොද්ධ ගෘහ නිර්මාණ ශිල්පීය අංග හා බෞද්ධ කලා කෘති නිර්මාණය වීමේ ක්‍රියාදාමය ඇරඹි බවක් දක්නට ලැබේ. මුල් බුදු සමයෙන් පෝෂිත කලා නිර්මාණ භාරතයේ දක්නට ලැබෙන අතර, පසු කාලීනව ව්‍යාප්ත වූ අවශේෂ රටවල ස්වාධීන කලා කෘති අතර ඉන්දීය කලා

කෘතිවල අභාසය හඳුනා ගැනීමේ හැකියාව ද තිබේ. බෞද්ධ දර්ශනය මෙන්ම බෞද්ධ සංකල්ප ද නිර්මාණාත්මකව දක්නට ලැබීම තුලින් පෙනී යන්නේ බෞද්ධාගමික සංස්කෘතික සංවර්ධනයක් ඇති කිරීමට මෙමඟින් හැකිවී ඇති බවයි. සමස්ත බෞද්ධ කලා කෘති අතර විශේෂත්වයක් ගනු ලබන්නේ බුද්ධ ප්‍රතිමාවයි. මෙය 'ප්‍රතිමා ප්‍රමාණ විද්‍යාව' දක්වා වර්ධනය විය.

බෞද්ධ චිත්‍ර කලාව පිළිබඳ ද්‍රව්‍යමය හෙවත් පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ විශේෂයෙන්ම ආසියානු කලාපීය රටවලිනි. දකුණු, අග්නිදිග හා මධ්‍ය ආසියානු රටවල බෞද්ධ චිත්‍ර කලාවේ ව්‍යාප්තිය, ඒවායෙහි ශේෂිත චිත්‍ර මෙන්ම ලිඛිත මූලාශ්‍ර ගත සාධක වලින් ද පැහැදිළි වේ. චීනය, මියන්මාරය, ඉන්දියාව, ශ්‍රී ලංකාව ආදී රටවලින් මේ සඳහා නිදර්ශනයන් හඳුනා ගැනීමට හැකිය. (Puri,1987).

ලිඛිත මූලාශ්‍රගත තොරතුරු අනුව බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දී පවා බෞද්ධ චිත්‍ර කලාව පැවති බවට සාධක සපයා ගත හැකිය. චුල්ලවග්ගයේ සඳහන් වන ආකාරයට (චුල්ලවග්ගපාලි, 1983, 2 කාණ්ඩය) ආරාමයක වර්ණ ගන්වා චිත්‍ර ඇඳීමට බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය ලැබී තිබේ. එසේම එහි සඳහන් වන ආකාරයට යමෙකුගේ චිත්ත සන්තානයන් අවුල් කරවන හා අර්ථශූන්‍ය චිත්‍ර ඇන්දවීම තහනම් වේ. ඒවා 'පටිභාන චිත්‍ර' ලෙස (ප්‍රතිභාන චිත්‍ර) අර්ථකථනය වේ. මෙකී 'පටිභාන' චිත්‍ර මෙවැනි වූ ස්ථාන ආශ්‍රිතව ඇන්දවීම පිළිබඳ තහනම් නියෝග පවා පනවා තිබේ. චුල්ලවග්ගයට අනුව කාමරූපී සිතුවම් පිළිබඳ විශේෂයෙන් සඳහන් කොට තිබේ. එනම් ලෞකිකත්වය හා එමගින් මනෝභාවයන් සසල කරවන චිත්‍ර සමූහයන් ඇඳීම පිළිබඳ තහනම් නියෝග පනවා තිබේ. 'පංච ලෙන්' ක්‍රමය පදනම් කොට ගෙන මෙම චිත්‍ර ඇඳීම සිදුවන්නට ඇති බව අනුමාන කළ හැකිය.

කෙසේ වෙතත් බෞද්ධ කලා කෘති වල ද්‍රව්‍යාත්මක සාධක ශේෂ වීම පිළිබඳ අපට දැනගන්නට ලැබෙන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් පශ්චාත් කාලීනවය. බුදුරදුන්ට ආරාමයක් තැනවූ විගස ඒවා සිතුවමින් ගහණ කළ යුතු බවට අවධාරණය වූ ආකාරය බෞද්ධ මූලාශ්‍ර ගණනාවකම සඳහන් වේ.

බෞද්ධ චිත්‍ර කලාවේ සමාරම්භක කාල පරිච්ඡේදයේදී බෞද්ධ කලා නිර්මාණ අපට හමුවන්නේ සාංචි, භාර්හුත් ආදී බෞද්ධ කැටයම් ලෙසිනි. මේවායේ පවා බුද්ධ රූපය දිස් නොවෙන අතර සංකේතානුසාරයෙන් පමණක් දක්නට ලැබීම විශේෂය. ඉහත සඳහන් කළ පරිදි භාරතීය කලා කෘති බෞද්ධ ඒවා ලෙස වඩා වැදගත් වේ. ක්‍රි. පූ. 1 වන හෝ ක්‍රි. ව. 1 වන අවධියේදී පමණ බුද්ධ රූප ඉන්දියාවේ නිර්මාණය වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මථුරාව හා ගන්ධාරය වැනි ප්‍රධාන කලා මධ්‍යස්ථාන භාරතයේ බෞද්ධ කලා කෘති නිර්මාණ ක්‍රියාදාමයෙහි සුවිශේෂී වී තිබේ. මෙම කේන්ද්‍රස්ථාන හරහා බුද්ධ රූප, බෝධිසත්ව රූප, ජාතක කතා රූප වැනි කලා නිර්මාණ ව්‍යාප්ත වී තිබේ. එසේම ගුප්ත යුගයේ කලා කෘති ක්‍රි.ව.320-650 පමණ කාලයේ සම්භාව්‍ය සම්ප්‍රදායක් කරා ගෙනයාමට සමත් වූ බව පෙනේ. ගුප්ත යුගය අවසාන වනවාත් සමඟම භාරතයේ හින්දු කලාව වර්ධනය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම ද විශේෂය. ඉන්දීය බෞද්ධ චිත්‍ර අතර අජන්තාව කිසිසේත් අමතක කළ නොහැකිය. අජන්තා ලෙන් සංකීර්ණය තුළ දක්නට ලැබෙන සුවිශේෂත්වය වනුයේ යුග ගණනාවක් තුළ වර්ධනය වන හා ස්ථානගත වන චිත්‍ර කලාවයි. ලෙන් විහාර හා චෛත්‍ය ශාලා ලෙස දක්නට ලැබෙන මෙම ස්ථාන බෞද්ධ චිත්‍ර කලාවට සේම බෞද්ධ වාස්තු විද්‍යාවට ද කදිම නිදසුන් සපයයි. මේ අතරින් අංක 1, අංක 4, අංක 10 ආදී ලෙන් ආශ්‍රිත චිත්‍ර සුවිශේෂී නිරූපණයන් සේ හුවා දැක්විය හැකිය. මහායාන කලා සම්ප්‍රදායේ උපරිමයන් විදහා පාන ඒවා අතරින් අංක 1 දරන ලෙන් සිතුවම් වැදගත් වේ. ජාතක කතා කීපයක් සහ පද්මපානි හා අවලෝකිතේශ්වර බෝධිසත්ව රූප මෙන්ම බුද්ධ

චරිතයේ අවස්ථා ආදිය දක්නට ලැබෙන මෙම ලෙන ක්‍රි.ව.5 වන සියවසේ පමණ නිම වන්නට ඇතැයි කාල නිර්ණය කර තිබේ. අජන්තාව, පද්මපානී බෝධිසත්ව චිත්‍රය නිසාම ලෝක ප්‍රසිද්ධ වී තිබේ. ලෙන් විශාල සංඛ්‍යාවක් දක්නට ලැබෙන මෙම භූමියේ බොහෝ ලෙන්වල බෞද්ධ චිත්‍ර දක්නට ලැබීම භාරතීය බෞද්ධ චිත්‍ර කලාවේ නිදර්ශන අතරට අජන්තාව එක් කිරීමට හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුරාතන ඓතිහාසික යුගයේ පටන් නූතන යුගය දක්වාම අද්‍යතන චිත්‍ර කලාව පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක ශේෂව පැවතීම වැදගත් වේ. මූලාශ්‍රගත සාධක අනුව බුදුසමය මෙරටට දායාද වූ අවධියේ පවා චිත්‍ර තිබුණු බවට ලිඛිත සාධක දක්නට ලැබේ. (හෙට්ටිගේ,1998). මේ අනුව පැහැදිලි වන කරුණක් නම් අනුරාධපුර රජධානියේ සිට වර්තමානය දක්වා ම ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාව අඛණ්ඩව දක්නට ලැබීම අතිශය වැදගත් කරුණක් වන බවයි. මෙහිදී මා වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වනුයේ ශ්‍රී ලාංකීය චිත්‍රකරණය දෙසටයි. මන්ද, මෙම ලිපියේ අරමුණු වනුයේ ශ්‍රී ලාංකීය චිත්‍රකරණයේ අන්තර්ගතය හා ස්ථාන නිරීක්ෂණය ඇසුරින් නිගමන කරා ළඟා වීම වන හෙයිනි. ඒ අනුව ආසියාතු බෞද්ධ චිත්‍ර කලාව පිළිබඳ හැඳින්වීම හා ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාවට අවධානය යොමු කරමින් එහි ඇති සුවිශේෂතා මතුකර දැක්වීමට අදහස් කෙරේ. එසේම ශ්‍රී ලංකා චිත්‍ර ධාරක ක්ෂේත්‍රය තුළ බුදු සමය කුමන බලපෑමක් කර තිබේ දැයි යන්න කෙරෙහි මෙහිදී අවධානය යොමු වේ.

## අන්තර්ගතය

ශ්‍රී ලාංකීය බෞද්ධ චිත්‍ර කලාව පිළිබඳ සියුම්ව අධ්‍යයනය කරන කල දක්නට ලැබෙන විශේෂත්වය වනුයේ ක්‍රි.පූ. යුග වල සිට වර්තමානය දක්වාම පැවති අඛණ්ඩ ගමන් මගයි. ඉතිහාසගත මූලාශ්‍ර අනුව ලංකාවට බුද්ධදහම ලැබීමෙන් අනතුරුව මෙම චිත්‍ර කලාව වර්ධනය වූ බවට සාධක හඳුනා ගැනීමට අපහසු නොවේ.

ශේෂිත පුරාවිද්‍යාත්මක සාධක සියල්ල අවධානයට යොමු කළ නොහැකි වුවත්, ලැබී ඇති සියලුම දත්ත නිරීක්ෂණයෙන් චිත්‍ර කලාව පිළිබඳ අදහසක් ඇති කරගත හැකිය. එසේම ස්ථානීය සාධක නිරීක්ෂණය කොට විශ්ලේෂණය කිරීමෙන් වර්ගීකරණයක් කරා එළැඹිය හැකිය. ශ්‍රී ලංකාවෙන් හමු වූ සියලුම චිත්‍ර සහිත ස්ථාන මෙම ලිපියේ අන්තර්ගත කිරීමට බලාපොරොත්තු නොවෙමි. මන්ද, එහි ඇති පුළුල් භාවය නිසාවෙනි. මෙම ලිපියේ අරමුණු අනුව අත්‍යවශ්‍ය සාධක පමණක් නිරීක්ෂණය කරමින් ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ අන්තර්ගතය හා ස්ථාන කීපයක් ආශ්‍රයෙන් නිගමන ඉදිරිපත් කිරීමට මෙහිදී බලාපොරොත්තු වෙමි.

ධාතු ගර්භ චිත්‍ර

මහාවංශයට අනුව දුටුගැමුණු රජු විසින් මහා ථූපයෙහි සිතුවම් ඇන්දවූ බවට සාධක ලැබේ. මෙය 'රුවන්වැලි සෑය' නමින් ප්‍රකටය. (Mahāvaüsa,1950). පශ්චාත් කාලීන ප්‍රතිසංස්කරණ වලින් පසු මේ චිත්‍ර ශේෂයන් පිළිබඳ පුරාවිද්‍යා සාධක නොමැති වීම විශාල අඩුවකි. කෙසේ වෙතත් ධාතු ගර්භ චිත්‍ර වල වැදගත්ම ද්‍රව්‍යමය ශේෂිතය මහියංගන ධාතු ගර්භ චිත්‍රයි. මෙය ලාංකීය චිත්‍ර ඉතිහාසයට සුවිශේෂය. සෙනරත් පරණවිතාන මහතාගේ මැදිහත්වීමෙන් මේවා සංරක්ෂණය කොට වර්තමානයේ පවා මහජනයා උදෙසා ප්‍රදර්ශනය වේ. මෙහි කාලය පිළිබඳ විවිධ අදහස් පළවී ඇතත් අනුරාධපුර යුගය හෝ පොළොන්නරු යුගය නියෝජනය වෙතැයි අදහස් කළ හැකිය. මහියංගන ධාතු ගර්භ චිත්‍ර සංරක්ෂණය කොට ප්‍රදර්ශනය කර තිබීම ලාංකීය උරුමය පිළිබඳ දෘශ්‍ය සාධක සපයා ගනු වස් මහගු මෙහෙවරක් ලෙස අගය කල යුතුය. (ASCAR, 1951,Pl:III,A&B). බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය පිළිබඳ ඓතිහාසික ප්‍රවෘත්තිය හා සම්බන්ධ වන මෙකී ස්ථානයේ ඇති ඓතිහාසික වැදගත්කම සඳහා මෙය කදිම නිදසුනකි. ශේෂිත චිත්‍ර සාධක යම් යම් යුග කරා සම්බන්ධ කිරීමට උත්සාහ ගත්ත ද

ඒවා ඒකීය ලක්ෂණ කරා ගොනු වේ. පරණවිතානට අනුව 'බුදුරදුන් බුද්ධත්වයට පැමිණීම සහ විෂ්ණු දේව රූප මෙහි දක්නට ලැබේ'. මෙම චිත්‍ර වල කාල පරාසය සම්බන්ධ විවිධ මත තිබුණ ද අනුරාධපුර හෝ පොලොන්නරු චිත්‍ර ලක්ෂණ බොහොමයකින් සමන්විත වන බව හඳුනා ගත හැකිය. (හෙට්ටිගේ,2009b).

මේ අනුව ලංකාවේ බුදුසමය හා සම්බන්ධ ප්‍රධාන ස්ථානය වන මිහින්තලේ ක්‍රි.පූ. යුග වල පටන් ක්‍රි.ව.9 වන සියවස පමණ වන තෙක්ම සබඳකම් පැවති ස්ථානයක් වන බවට මූලාශ්‍රගත සාධක සාක්ෂි සපයයි. (Mahāvaüsa,1950). පුරාවිද්‍යා පාලන වාර්තා වලට අනුව මහා සෑය හා කණ්ඨක චෛතිය අසල වූ චෛත්‍යයක ධාතු ගර්භ චිත්‍ර දක්නට ලැබුණු බව පරණවිතාන සඳහන් කරයි. (ASCAR,1951). පරණවිතානට අනුව මෙම විශේෂ දාගැබ් ගර්භය තුල බදාම ගන්වා හුණු පිරියමින් චිත්‍ර අන්දවා තිබුණු බව කියවේ. මේ අතර රූප අවශේෂ හඳුනා ගත නොහැකි වූ නමුදු ඒවායේ වර්ණ සංකලනය අනුව රතු, කොළ සහ කහ පැහැයේ ශේෂයන් හඳුනාගත හැකි වී තිබේ. බෞද්ධ වාස්තු විද්‍යාවේ විශේෂතම නිර්මාණයක් වන "ස්ථූප" ඇසුරෙහි චිත්‍ර දක්නට ලැබීම දුර්ලභ සංසිද්ධියක් බව ජගත් කලා ඉතිහාසය පිරික්සීමෙන් නිගමනය කළ හැකිය.

වාහල්කඩ චිත්‍ර

බෞද්ධ වාස්තු විද්‍යාවේ ආරම්භක නිර්මාණ අතර චෛත්‍යය සඳහා විශේෂ ස්ථානයක් හිමි වන අතරම එහි වර්ධන අවස්ථාවක් ලෙස 'වාහල්කඩ' හඳුන්වා දිය හැකිය. සතර මුඛ පාර්ශවීය ලෙස නිර්මිත මෙම අකෘතිය ද වාස්තුවිද්‍යාත්මකව සුවිශේෂ ලක්ෂණ හුවා දක්වන බව සත්‍යයකි. පුරාණ ලාංකීය වාස්තු විද්‍යාව තුළ මෙම විශේෂ අංගය මුල් ඓතිහාසික යුගයේ දීම නිර්මාණය වී තිබෙන බවට වර්තමානයේ පවා අවශේෂ ආරක්ෂා වී තිබීම ශ්‍රී

ලාංකීය වාස්තු උරුම ඉතිහාසයට ද වැදගත් වේ. මෙම විශේෂ වාස්තු ආකෘතිය බොරදම්, කැටයම්, මූර්ති හා චිත්‍ර ආදියෙන් අලංකරණය වී තිබුණු බව පුරාවිද්‍යා වර්තා වලින් සනාථ වේ. ඒවායේ ඇති ද්‍රව්‍යාත්මක ශේෂයන් මගින් අදටත් මේ බව පසක් කර ගැනීමේ හැකියාව ලැබේ. වාහල්කඩ නිර්මාණය වීමේ ආරම්භක අවස්ථාව අනුරාධපුර යුගයයි. අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය, රුවන්වැලිසෑය වැනි මුල් කාලීන සුවිශාල දාගැබ් මීට කදිම නිදසුන්ය. මෙම ඓතිහාසික යුගය ලාංකීය වාස්තු විද්‍යාවේ හා කලාවේ ස්වර්ණමය යුගය ලෙස ද වැදගත් වේ. ඒවා ඉතාමත්ම අලංකාරව නිර්මාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ණ ගන්වන ලද චිත්‍ර ද තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. වාහල්කඩ චිත්‍ර වූ බවට සාධක හමු වන්නේ රුවන්වැලි සෑය සහ මිහින්තලේ ඇසුරෙනි. රුවන්වැලි සෑයේ වාහල්කඩ චිත්‍ර පිළිබඳ මුල්ම සඳහන දක්නට ලැබෙන්නේ ස්මිදර්ගෙනි. (Smither,1895). ඔහුගේ අදහසට අනුව මෙම සිතුවම් අනුරාධපුර යුගයේ පශ්චාත් භාගය නියෝජනය කරයි. ඉදිරි වාහල්කඩේ දක්නට ලැබෙන මෙම චිත්‍ර හුණු බදාමයෙන් සමන්විත පෘෂ්ඨයක සියුම් මටසිලිටි ආකාරයෙන් තොරව නිර්මිත බව ඔහු පවසයි. ලියවැල් මෝස්තර, බහිරව රූප, කාන්තා රූප ආදියෙන් මෙම රුවන්වැලි සෑයේ වාහල්කඩ සමන්විත වී තිබුණි. (Smither,1895,Pl:XXXII). එසේ වුවද මෙහි චිත්‍ර සැලසුම්කරණය අතින් උසස් ලක්ෂණ පෙන්නුම් කරයි. කුරුලු රූප, මල් සහ කොළ ද මෙහි අවශේෂ අතර අන්තර්ගතය. රතු, කහ, නිල් වර්ණ වලින් යුක්තය. ස්මිත්ට අනුව අජන්තා චිත්‍ර වල ලක්ෂණ පිළිබිඹු වේ. (Smith,1911).

මිරිසවැටි චෛත්‍ය වාහල්කඩ ද හුණු පිරියම්න් වූ බවට සාධක ලැබෙන අතර ඒවා වර්ණකයන්ගෙන් ද සමන්විත වූ බව ස්මිදර් පවසයි. (Smither,1895). නමුත් චිත්‍ර අන්තර්ගතය පිළිබඳ කිසිඳු අදහසක් දිය නොහැකි බව ද ඔහු සඳහන් කරයි.

## ලෙන් චිත්‍ර

ශ්‍රී ලංකාවේ ශෛලමය ආධාරක මත ඇඳි චිත්‍ර වර්ග ගණනාවකි. මෙහි දී මා අවධානය යොමු කරනු ලබන්නේ සකස් කරන ලද ලෙන් උපයෝගි කරගනිමින් කර ඇති චිත්‍ර ස්ථානයි. ඒ අතරින් හිඳගල, කරඹගල, සීගිරිය, දිඹුලාගල, පුල්ලිගොඩ හා මාරාවිදිය වැනි ස්ථාන වඩාත් වැදගත් වේ. මෙයින් සීගිරි බටහිර ගුහාවේ ඇති ප්‍රධාන කාන්තා රූප බෞද්ධ චිත්‍ර සම්ප්‍රදායෙන් මිදුණු ඒවා ලෙස හැඳින්විය හැකිය. ඒ හැර සෙසු ස්ථාන සියල්ලම බෞද්ධ චිත්‍ර සහිත ස්ථාන වීම විශේෂත්වයකි. ලාංකීය චිත්‍ර ඉතිහාසයේ සීගිරිය අතිශය සුවිශේෂී ස්ථානයක් ලෙස ලොව ප්‍රසිද්ධ වුවද එහි සුන්දරත්වය අතිශයින්ම සම්භාව්‍ය වේ. හිඳගල චිත්‍ර, ලාංකීය ඉතිහාසයට සුවිශේෂ වන්නේ එහි ඇති අනුරාධපුර යුගය නියෝජනය කරන බෞද්ධ චිත්‍රයෙන් සහ ශිලාලේඛන සාධක වලිනි. මෙම ස්ථානයේ වර්තමාන ලෙන් විහාරයක් දක්නට ලැබුණ ද ලෙනෙහි බාහිරින් දක්නට ලැබෙන මෙම බෞද්ධ චිත්‍රය ශ්‍රී ලාංකීය සිතුවම් කලාවට බෞද්ධ නිදර්ශන සපයන ප්‍රධානතම සාධකයකි. (Paranavitana,1959). භූගෝලීය පිහිටීමෙන් මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයෙන් කි.මී.9ක් දුරින් මහකන්ද ආසන්නයෙහි ස්ථානගත වී ඇති මෙහි පිහිටීමේ සුන්දරත්වය ද පාරිසරික වශයෙන් අලංකාරත්වයක් ගනී. හුණු බදාමය පිරියම් වූ පර්වත පෘෂ්ඨය මත වර්ණ සහිතව මෙම චිත්‍ර ඇඳ තිබීමෙන් දේශගුණික හා පාරිසරික හායනකාරක එහි උරුමය සීඝ්‍රයෙන් අවශෝෂණය කරගනු ලබයි. 'ඉන්ද්‍රසාල ගුහාවේ වැඩ විසූ බුදුරජාණන් වහන්සේ හමු වීමට ශක්‍රයා පැමිණි අවස්ථාව මෙහි නිරූපණය වන බව ප්‍රකටය.' (පරණවිතාන,1964). කහ, දුඹුරු සහිත රතු, මෙන්ම තැඹිලි පැහැය සහිත මේ චිත්‍රය සීගිරි අජන්තා සම්භාව්‍ය සම්ප්‍රදායට නෑ කම් කියයි. (හෙට්ටිගේ,2009a). මෙහි වර්තමානයේ ශේෂිතය අවම වී ඇති අතර එහි පිටපත් ජාතික කෞතුකාගාරයේ ඇත.

"කරඹගල" ද ලෙන් පෘෂ්ඨයක බදාම ගල්වා කරන ලද චිත්‍රයකි. මෙහි අවශේෂ 20 වන සියවස මුල් භාගය වන විටත් පැවති බව පොත පතින් අනාවරණය වේ. ලෙන් චිත්‍ර වලට පැරණිතම නිදර්ශනයක් ලෙස (ක්‍රි.පූ.2) හා බෞද්ධ චිත්‍ර සහිත ස්ථානයක් වශයෙන් ද මෙහි ඇති වැදගත්කම අති මහත්ය. 'බෝසත් හා අප්සරාවකගේ' රූප ද්වයක ශේෂ පමණක් ඒ වන විටත් පැවතීම බෞද්ධ ලෙන් චිත්‍ර කලාව සඳහා නිදසුන් ලබා ගැනීමට අප ලද භාග්‍යයකි.

දිඹුලාගල මාරාවිදිය චිත්‍ර ද මෙහිදී සඳහන් කළ යුතුමය. සස ජාතකය, වෙස්සන්තර ජාතකය වැනි ජාතක කතා සිතුවම් මෙහි දක්නට තිබී ඇතත් මේ වනවිට සීමිත අවශේෂ පමණක් ශේෂ වී ඇත. (Wijesekara,1959). අතිශය දුෂ්කර දිඹුලාගල ගිරි සංකීර්ණයෙහි චිත්‍ර විශේෂ වන්නේ ඓතිහාසික මූලාශ්‍ර වල මහානාම රජුගේ (ක්‍රි.ව.406-428) විහාර පූජාවක් පිළිබඳ ප්‍රවෘත්තිය නිසාවෙනි. බ්‍රාහ්මී ලිපි හා වෙනත් පුරාවිද්‍යා සාධක වලින් ද මෙහි ඉතිහාසය ක්‍රි.පූ. 3 වෙනි සියවසට ආසන්න බව අනාවරණය වේ. ලෙන් ආශ්‍රයෙහි හුණු බදාම ගල්වා ඇඳ ඇති මෙම චිත්‍රය ද ජාතක කතා චිත්‍ර සඳහා ශ්‍රී ලංකාවෙන් ලැබෙන පැරණිතම සාධකය බවට අනුමාන ඇති කරගත හැකිය. කෙසේ වෙතත් ලාංකීය බෞද්ධ චිත්‍ර කලාවට මෙම මාරාවිදිය චිත්‍ර සාධක අතිශය වැදගත් වේ.

*ගල්විහාර චිත්‍ර*

සම්පූර්ණයෙන්ම පර්වතය පාදක කරගෙන නිර්මිත පොලොන්නරුවේ ගල් විහාරය මත ඇඳ ඇති චිත්‍ර ලංකාවට පමණක් විශේෂ ස්ථානයක් ලෙසත් බෞද්ධ චිත්‍ර සහිත ස්ථානයක් ලෙසත් වැදගත් වේ. චිත්‍ර අතර මෙය විශේෂ ස්ථානයක් වනවා සේම මූර්තිකරණය අතින් ද මෙහි ඇති විශේෂත්වය වනුයේ තුන් ඉරියව්වෙන් නෙලූ බුද්ධ ප්‍රතිමා ඇති එකම ස්ථානය වීමයි.

පොළොන්නරු ඓතිහාසික උරුමය නියෝජනය කරන පුරාවිද්‍යාත්මක සාක්ෂි අතර සිතුවම් වලට ලැබෙන්නේ ද අද්විතීය ස්ථානයකි. පළමුවන පරාක්‍රමබාහු රජු දවස (ක්‍රි.ව.1153-1186) නිර්මාණය වන්නට ඇතැයි අනුමාන කරන ගල් විහාර චිත්‍ර වල සමස්ථ අන්තර්ගතය පිළිබඳ සාධක හමු නොවේ. සජීවී රේඛාකරණය ආධාරයෙන් ඇඳ ඇති මෙම චිත්‍ර වල නිර්මාණීය ලක්ෂණ මෙන්ම ස්ථානීය සුවිශේෂත්වය අනුව බෞද්ධ චිත්‍ර සාධක නියෝජනය කරන තවත් ස්ථානයක් සේ වැදගත් වේ.

ලෙන් විහාර චිත්‍ර

ක්‍රිස්තු පූර්ව යුග වලදී පවා ලෙන් කටාරම් කොටා භාවිතා වූ බවට සාධක ශ්‍රී ලංකාව සිසාරා හමුවේ. එහෙත් ලෙන් විහාර සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වනුයේ මහනුවර යුගයේදීය. එසේ වුවද ලෙන් ආරාම නිර්මාණය පිළිබඳ සාධක ඊට වඩා ඈත ඉතිහාසයකට දිවෙතත් හිඳගල සිතුවම් සාධක බොහොමයක් මහනුවර යුගය නියෝජනය කරයි. පිහිටි ලෙනක් පාදක කර ගනිමින් නිර්මාණය වී ඇති මෙකී විහාර ස්ථාන චිත්‍ර දෙවර්ගයකි. එනම්,

1. ඒක රූපී ලෙන් විහාර චිත්‍ර
2. බහු රූපී ලෙන් විහාර චිත්‍ර

ඒක රූපී ලෙන් විහාරවල එක් ලෙනක් පමණක් පදනම් වී ඇති අතර බහු රූපී ලෙන් විහාරවල ලෙන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලෙන් සංකීර්ණයක් සේ ස්ථානගත වේ. දෙගල්දොරුව රජමහ විහාරය ඒක රූපී ලෙන් විහාර සඳහා කදිම නිදර්ශනයකි. දඹුල්ල රජ මහ විහාරය බහු රූපී ලෙන් විහාර සඳහා නිදසුන් සේ ගත හැකිය. කඳුකරය ආශ්‍රිතව මෙම ලෙන් විහාර චිත්‍ර බහුලව දක්නට ලැබීමට ප්‍රධානතම හේතුව වනුයේ පාරිසරික වශයෙන් ඒවා ස්ථානගත වීමේ වැඩි ප්‍රවණතාවයක් ඒ ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබීමයි. බොහෝ විට මෙකී ලෙන් විහාර වල සැතපෙන

පිළිමයන් දක්නට ලැබෙන අතර විහාර ගෙය තුළ හා පිටත බිත්තිවල චිත්‍ර ඇඳ තිබේ. බෞද්ධ චිත්‍ර කලාවේ ඉතා වැදගත්ම චිත්‍ර හමුවන මහනුවර යුගයේ දී මෙම ස්ථාන ඇසුරෙහි හමුවන බොහෝ සාධක ඇති බව සත්‍යයකි. දෙගල්දොරුව, හිඳගල, රිදී විහාරය මේ සඳහා තව දුරටත් නිදර්ශන සපයනු ඇත. ජාතක කතා, බුදුසිරිත, සොළොස්මස්ථාන ආශ්‍රිත බොහෝ බෞද්ධ චිත්‍ර ලෙන් විහාර ඇසුරෙහි අදටත් ශේෂ වී තිබේ. සමහරක චිත්‍ර නවීකරණය වී ඇත. හිඳගල විහාරයට අභිමුඛ බිත්තියේ නව යුගයක චිත්‍ර දක්නට ලැබේ. ලෙන් විහාර චිත්‍ර අතරින් තවමත් වැඩි ප්‍රතිශතයක් ප්‍රකෘති සාධක දක්නට ලැබෙන ස්ථානයක් ලෙස දෙගල්දොරුව චිත්‍ර වැදගත් වේ. මාර පරාජය, සොළොස්මස්ථාන, ශාන්තිවාදී ජාතකය, අයෝඝර ජාතකය, වෙස්සන්තර ජාතකය, මහා සීලව ජාතකය, සුතසෝම ජාතකය සහ සත්තුභත්ත ජාතකය යන ජාතක කතා වලින් සමන්විත වන මෙම දෙගල්දොරුව චිත්‍ර වල ප්‍රකෘති දත්ත දක්නට ලැබීම ඉතා වැදගත් වේ. මහනුවර යුගයේ චිත්‍ර වල දක්නට ලැබෙන ශෛලීය ලක්ෂණ සහ එකී සම්ප්‍රදාය හඳුනා ගැනීමට පවා මෙම ස්ථානීය චිත්‍ර මහෝපකාරී වේ.

බහු රූපී ලෙන් විහාර අතර දඹුලු ලෙන් විහාරය වැදගත් වන අයුරු ඉහත සඳහන් කළෙමි. එක් ප්‍රධාන ලෙන් පර්වතයක අවශේෂ ලෙන්, කුටි ස්ථාන ගත වූ ලෙන් සංකීර්ණයක් ලෙස මෙය අර්ථ දැක්විය හැකිය. ප්‍රධාන ලෙන් විහාරයක් සහ අවශේෂ ලෙන් දක්නට ලැබෙන අතර ප්‍රධාන ලෙන් විහාරය මහරජ විහාරය ලෙස හඳුන්වා තිබීම ද චිත්‍රකරණයටම ආවේණික ලක්ෂණ විදහා පෑමට සමත් වනු ඇත. ප්‍රධාන ලෙන් පහකින් සමන්විත වන මෙහි ඉතිහාසය ක්‍රි.පූ. යුග කරා දිවෙන බව ශිලාලේඛන සාධක අනුව සනාථ වේ. ශේෂිත චිත්‍ර සාධක බොහොමයක් ඊට පසු කාලීන බවද නොරහසකි. මේවා අනුරාධපුර පොළොන්නරු කාල හා සම්බන්ධකම් පවතින බවට පුරාවිද්‍යා සාධක සාක්ෂි සපයයි. එසේම නරේන්ද්‍රසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ යන රජවරුන්ගේ සන්නස් හා තුඩපත් සාධක වලින්

මෙන්ම නිලගම තුඩපතින් මෙහි චිත්‍රකරණයට සම්බන්ධ කරුණු බොහොමයක් අනාවරණය වේ. සැතපෙන, හිඳි, හිටි යන තුන් ඉරියව්වෙන් සමන්විත බුදු පිළිම සහිත ලෙන් විහාර, ලාංකීය වාස්තු විද්‍යාවට විශේෂත්වයක් ගෙනදේ. චිත්‍ර ස්ථානගත වීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී පහත සඳහන් පරිදි ඒවා හඳුනා ගත හැකිය.

ලෙන් අංක 1 - දෙව්රජ විහාරය (රහත් රූප, ප්‍රධාන පිළිමයට පසුබිම් වූ බෝධි වෘක්ෂයක්, විශ්වකර්ම දේව රූප ඇතුළු දේව රූප සහ සුවිසි විවරණ මෙන්ම මල් මෝස්තර)

ලෙන් අංක 2 - මහරජ විහාරය (ස්කන්ධ හා විභීෂණ දේව රූප, දුටුගැමුණු යුද්ධය, රුවන්වැලි හා මිරිසවැටි ස්ථූප පූජාව, වියන් තලය ඇසුරෙහි මාර පරාජය, බුද්ධත්වය, පූජාභූමි, ලක්දිව බුදු දහමේ ඉතිහාසය, මල් මොස්තර සහ විජයාවතරණය)

ලෙන් අංක 3 - මහා අලුත් විහාරය (රහත් රූප, ප්‍රභූ රූප, හිමාල වනය, ස්ථූප, දේව රූප, වෘක්ෂලතා, පොකුණු, බෝසතාණන් වහන්සේ තුසිත දිව්‍ය භවනේ වැඩ හිඳීම සහ බුදුරැස් වළලු ආදිය)

ලෙන් අංක 4 - පශ්චිම විහාරය (ස්ථූපයට වැඳ නමස්කාර කරන රහත් රූප, සොළොස්මස්ථාන අවස්ථා කිහිපයක්, බුදු සිරිතේ සිදුවීම්)

ලෙන් අංක 5 - දෙවන අලුත් විහාරය (නව සම්ප්‍රදායක චිත්‍ර මෙහි දක්නට ලැබෙන අතර රහත් රූප, ප්‍රභූ රූපයක්, විෂ්ණු හා කතරගම දේව රූප ආශ්‍රිත රැස් වළලු සහ වියන් තලයෙහි දහම් දෙසීම, රහත් රූප හා බුදුරදුන්ගේ චිත්‍ර)

මෙම චිත්‍ර පිළිබඳ කාලනිර්ණ හෝ ශෛලිය නිශ්චය කිරීම ඉතාම අසීරු වනුයේ ප්‍රතිසංස්කරණ හා නැවත වර්ණ ගැන්වීම් නිසාවෙනි. අවධි වශයෙන් ගත් කල දළ වශයෙන් අවධි තුනක් පමණ හඳුනා ගත හැකිය. අලංකාරවත් චිත්‍ර, කීර්ති ශ්‍රී රාජසිංහ යුගය නියෝජනය කරයි (ක්‍රි.ව.1747-1780). මෙම බහු රූපී ලෙන් විහාරකරණයේ සංකීර්ණතම නිදසුන් දඹුල්ලෙන් හමු වීම නිසා එම ස්ථානය වැදගත් වේ. ස්ථාන නිදර්ශන ගණනාවක්ම මේ වනවිට ශේෂව තිබීම තවත් විශේෂයකි.

*ටැම්පිට විහාර චිත්‍ර*

ටැම්පිට විහාර සම්ප්‍රදාය ලාංකීය බෞද්ධ වාස්තු විද්‍යාවට නව්‍ය ශෛලියක් හඳුන්වා දුන් අවස්ථාවක් විය. එසේම මෙම විහාර සම්ප්‍රදාය හුදෙක්ම ශෛලමය කණු මත දැව බාල්ක යොදා ඒ මත වරිච්චි හෝ වෙනත් අමුද්‍රව්‍යයක් භාවිතා කර ඉදි කොට පෙති උළු අතුරමින් අලංකාර ලෙස නිමවූ ප්‍රතිමා ගෘහ විශේෂයකි. මහනුවර යුගයේදී කන්ද උඩරට රජධානිය ඇසුරෙහි මෙම විහාර ඉදිවීම ආරම්භ වුවද ලංකාවේ සෙසු ප්‍රදේශ සිසාරා ද මෙම වාස්තු විද්‍යා ආකෘතිය නිර්මාණය වීමේ ප්‍රවණතාවක් දැකගත හැකි වේ. ප්‍රමාණයෙන් වඩා විශාල නොවූ මෙම ගොඩනැගිලි වල ප්‍රධානවම හිඳි බුදු රුවක් ස්ථානගත වනු දැකිය හැකිය. බොහෝ විට මෙම ටැම්පිට විහාර ඇසුරෙහි දක්නට ලැබෙන චිත්‍රකරණයද වාස්තු විද්‍යාත්මක වශයෙන් මෙන්ම අලංකාරත්වයෙන් හෙබි සුමට ඒවා වීම ද සුවිශේෂය. බුදු සමයේ අනභිබවනීය ප්‍රතිඵලයක් ලෙස අපට දායාද වී ඇති මෙම චිත්‍ර සඳහා තවමත් විශිෂ්ට නිදසුන් ශේෂ වී තිබීම ද සිංහල බෞද්ධ උරුමයේ විශේෂත්වය තීව්‍ර කරයි. මහනුවර ප්‍රදේශබඳ මැදවල ටැම්පිට විහාරය, සූරියගොඩ වැනි ස්ථාන මේ සඳහා කදිම නිදසුන් සපයයි. වර්තමාන කෑගල්ල, මහනුවර, ගම්පහ, කුරුණෑගල, රත්නපුර වැනි දිස්ත්‍රික්ක සිසාරා මේවා ඓතිහාසිකව නිර්මාණය වීමේ වැඩි ප්‍රවණතාවක් දැකිය හැකිය. මහනුවර රාජධානි

සමයේ රාජ අනුග්‍රහය සහ සරණංකර හිමිගේ අප්‍රමාණ ධෛර්ය මේ සඳහා බොහෝ දුරට බලපා ඇති බව සන්නස් හා තුඩපත් අධ්‍යයනය කිරීමෙන් පෙනේ. සිවිලිම දුවයෙන් නිර්මාණය වී ඇති මේවායෙහි බොහෝ විට අලංකාරවත් චිත්‍ර දක්නට ලැබේ. සිවුපස බිත්ති ආශ්‍රයෙහි ප්‍රධානතම සිතුවම් ආවලිය ඇතුලත් වේ. කලාතුරකින් පිටත බිත්ති වල චිත්‍ර දක්නට හැකි වේ. මැදවල විහාරයෙහි ද චිත්‍ර අන්තර්ගතය වනුයේ වෙස්සන්තර ජාතකය, උරග ජාතකය, සත්සතිය, සොළොස්මස්ථාන මෙන්ම රහත් රූප, ප්‍රභූ රූප සහ සේවක රූප යනාදියයි. සූරියගොඩ ටැම්පිට විහාරයෙහි චිත්‍ර අන්තර්ගතය වනුයේ ප්‍රධාන වශයෙන්ම සිදුහත් කුමරෝත්පත්තියේ සිට බුද්ධත්ත්වය දක්වා සංසිද්ධීන්ය. මහනුවර යුගයේ සමාජ ප්‍රවණතා, බලපෑම්, ලක්ෂණ, ශෛලිය හා සම්ප්‍රදායන් ද මෙයට බලපා තිබේ. කාලීන වශයෙන් එකම යුගයකට සහ එකම රාජ්‍ය කාලයන්ට ඇති සම්බන්ධතාවය එයට හේතුව වී ඇත. (ක්‍රි.ව.17,18 සියවස්). සියලු ලාංකීය ටැම්පිට විහාර චිත්‍ර වල බෞද්ධාගමික විහාර සිතුවම් පමණක් දක්නට ලැබේ. නමුත් ශෛලිය හා සම්ප්‍රදායන් ලෙස යම් යම් වෙනස්කම් පවතී. නිදර්ශන ලෙස ගතහොත් ඕමල්පේ ටැම්පිට විහාරයේ චිත්‍ර ඉහත ඒවාට වෙනස්කම් දැක්වුව ද අන්තර්ගතය වශයෙන් සාම්‍ය වේ. ඇඹිලිපිටිය ආසන්නයෙහි පිහිටි මෙය දෙමහල් ආකාරයට නිර්මාණය වීම විශේෂත්වයකි. ඉහත මාලයේ චිත්‍ර දක්නට ලැබෙන අතර දහම්සොඬ සහ දේවධම්ම ජාතකයත් කතරගම, ඊශ්වර සහ සමන් ආදී දේව රූපත් අරහත් රූප සහ බුද්ධ රූප මෙන්ම සක් පිඹින්නාගේ රූපයත් මේ චිත්‍ර අතර වැදගත් වේ (ගුණසිංහ,1964) (හෙට්ටිගේ,1998b).

## පෙතිකඩ චිත්‍ර

රෙදි මත චිත්‍ර ඇඳීමේ ක්‍රමය අනුරාධපුර යුගයේ සිටම පැවති බවට 'පට චිත්‍ර' පිළිබඳ මහාවංශගත සාධක මූලාශ්‍ර සපයයි. (Mahāvaüsa, 1950). එහෙත් රෙදි මත නිමවූ පෙතිකඩ චිත්‍ර ලෙස පසු කාලීනව ප්‍රසිද්ධියට පත් චිත්‍ර සාධක දූඹව, හඟුරන්කෙත

වැනි ස්ථාන වලින් අපට සත්‍ය ලෙසින්ම දැකගත හැකි වීම ද භාග්‍යයකි (හෙට්ටිගේ,1998a). කොළඹ ජාතික කෞතුකාගාරයෙහි ද මේ සඳහා නිදර්ශන කිපයක් දක්නට ලැබේ. ශේෂිත පුරාවිද්‍යාත්මක සාධක ලෙස මෙසේ හඳුනාගත හැකි මෙම චිත්‍ර වල මහනුවර සම්ප්‍රදායානුගත චිත්‍ර ශෛලියක් හඳුනාගත හැකිය. එහෙත් මේවායෙහි ද විශේෂත්වය වනුයේ තීරු ක්‍රමය ලෙස ස්ථානගත වූ ජාතක කතා දක්නට ලැබීම සහ ප්‍රධාන බුදු පිළිමය කේන්ද්‍ර කොට ගෙන චිත්‍ර ස්ථානගත වීමයි. බුදු දහම ජනයා අතරට ගෙන යාමේ අනන්‍ය ලක්ෂණයක් ලෙස හෝ විහරස්ථාන වල පූර්ව සැලසුම් චිත්‍ර ලෙස මෙම චිත්‍ර නිර්මාණය වී ඇති බව පෙනේ. මේවා බෞද්ධ චිත්‍ර කලාවට ම නෑකම් කියනු ලැබේ.

*වෙනත් පිළිම ගෙවල් චිත්‍ර*

සම්පූර්ණ ගඩොල් හෝ වෙනත් බිත්ති ආධාරක යොදා කෘත්‍රිමව නිමවූ පිළිම ගෙවල් රාශියක චිත්‍ර මේ වනවිට අනාවරණය කරගෙන තිබේ. තිවංක පිළිම ගෙයි චිත්‍ර මේ අතරින් වැඩි පෞරාණික වැදගත් කමක් දරයි. ගඩොළුමය ඉදි කිරීමක් වන මෙහි චිත්‍ර අන්තර්ගතය පරිපූර්ණය. බෞද්ධ සිද්ධි හා ජාතක කතා වලින් අසංකවතී, සස, සාම, උම්මග්ග ආදී බොහෝ ජාතක කතා හා දේවාරාධනාව ආදී විශේෂ සිද්ධි ගණනාවකින් සමන්විත මෙහි චිත්‍ර සමස්තය බුදු දහමින් පෝෂණය වී තිබේ.

ලේවැල්ල ගංගාරාමය ආශ්‍රිත චිත්‍ර ද ශ්‍රී ලාංකීය බෞද්ධ චිත්‍ර කලාවෙහි විශේෂිත ස්ථානයකි. එය මහනුවර රාජධානිය තුළ නිර්මාණය වූ සුවිශේෂී චිත්‍ර ශෛලියක් නියෝජනය කරයි. සොළොස්මස්ථාන, දහසක් බුදුවරු සහ සිදුහත් උපතේ සිට බුදුවීම හා පරිනිර්වාණය දක්වා වූ බුදු සිරිතේ සුවිශේෂී සිද්ධි ඇතුලත් විශේෂ ස්ථානයක් ලෙස මෙහි ඇති වැදගත්කම අතිමහත්ය. බුදුන් කපිලවස්තු පුරයට වැඩමවීම, රාහුල කුමරු පැවිදි කිරීම ආදී විශේෂ සිද්ධි මෙහි අන්තර්ගත වේ.

මෙවැනි වාස්තු ආකෘතියට නිමවූ ස්ථාන හා චිත්‍ර පසු කාලීනව පවා දක්නට ලැබේ. කැලණිය පැරණි විහාරය, කැලණිය නව විහාරය, කෝට්ටේ රජමහ විහාරය ඉන් කිහිපයකි.

## වටදාගෙවල් චිත්‍ර

මේ සඳහා පැරණිතම නිදසුන් අපට ශේෂව නැතත් වටදාගෙවල් නිර්මාණය වීමේ වාස්තු විද්‍යාත්මක මුහුණුවර අනුරාධපුර යුගයෙන් ආරම්භ වේ. බෞද්ධ වන්දනා ක්‍රම බිහි වීමේ හා ස්ථූප වන්දනාවේ උච්ඡතම අවස්ථාව ලෙස වටදාගෙවල් නිර්මාණය වීම පුරාණ ලාංකීය වාස්තු විද්‍යාවෙන් හඳුනා ගත හැකිය. එහෙත් ස්ථූපය වටකොට ඉදි වූ ගෙය මෙනමින් ප්‍රචලිත වුවත් දාගැබ තුළ චිත්‍ර අන්දවා වටදාගෙවල් තැනූ නිදර්ශන අපට හමු වන්නේ පසු කාලීනවය. වර්තමානයෙහි අත්තනගලු රජමහ විහාරය අනුරාධපුර ඓතිහාසික යුගයට සම්බන්ධකම් පැවතෙන ස්ථානයක් ලෙස ජනප්‍රවාදයේ ඇතත් එහි දක්නට ලැබෙන චිත්‍ර පශ්චාත් කාලීනය. මෙම චිත්‍ර මහනුවර සම්ප්‍රදාය ඇසුරු කොටගෙන නිර්මිත පශ්චාත් කාලීන නියෝජනයක් කරන බව පැහැදිලිය. සූවිසි විවරණය, අලංකාරිත මල් මොස්තර ආදියෙන් සමන්විත මේවා වර්තමානයේ දී දැකගත හැකිය.

## ධර්ම මණ්ඩප චිත්‍ර

මහනුවර යුගයෙන් පසු ඇතැම් විහාර වල ධර්ම මණ්ඩපය දැවයෙන් අලංකාර ලෙස කැටයම් කරවා ඒ මත චිත්‍ර ඇඳීමේ ක්‍රමය දක්නට ලැබේ. බස්නාහිර පළාත්බද කරගම්පිටිය රජමහ විහාරයේ එවැනි චිත්‍ර වර්තමානයෙහි පවා දක්නට ඇත (ක්‍රි.ව.1894). දෙහිවල සුබෝධාරාමය නමින් ප්‍රචලිත මෙම ස්ථානයෙහි දක්නට ලැබෙන ධර්ම මණ්ඩප චිත්‍ර මහනුවර සම්ප්‍රදාය ඇසුරු කොටගෙන නිර්මිත ඒවාය. අලංකාර මල් ලියකම්, පෙරහැර දර්ශන, සත්ත්ව රූප මෙම චිත්‍ර වල අන්තර්ගතය සේ හඳුනා ගත හැකිය. මෙවැනි නිදර්ශන ශ්‍රී ලාංකීය ප්‍රාදේශීයබද ස්ථාන ඇසුරෙහි තවත් පවතී.

## සාර්ලිස් චිත්‍ර

කොළඹ යුගයේ චිත්‍ර ඇසුරෙහි දක්නට ලැබෙන සුවිශේෂී චිත්‍ර නිදර්ශන ලෙස මේවා හඳුන්වා දිය හැකිය. බෞද්ධාගමික සංසිද්ධීන් මුල් කොටගෙන ඇම්.සාර්ලිස් මහතා විසින් ඇඳින ලද චිත්‍ර සිංහල බෞද්ධ ජන සමාජය තුළ ඉතා හොඳින් අගය කළ සාමාන්‍ය බෞද්ධ ජනතාවගේ සිත් ඇද බැඳ ගත් චිත්‍ර විශේෂයකි. පින්තාරු මුද්‍රණ ලෙස බොදු ජනයා ඉතා භක්තියෙන් වැළඳ ගත් මෙම සිතුවම් සෑම නිවසකම ඉදිරිපස විථෘත පෙළෙහි එල්වා තැබීම සිරිතක් ලෙසම මුල් බැසගෙන තිබුණි. පැරණි බව රැකෙන ඇතැම් නිවාස ඇසුරෙහි තවමත් මේවා දක්නට ලැබේ. ප්‍රමාණයෙන් එතරම් විශාල නොවූ ආයත චතුරස්‍රාකාර චිත්‍ර පනේල ලෙස මේවා දක්නට ලැබුණු අතර බොහෝ විට නිරය දර්ශන වලින් සමන්විත වී තිබුණි. බුදු දහමේ වැදගත් සිදුවීම් අළලා නිර්මිත මෙම චිත්‍ර වල වර්ණ හා සංරචනය බෞද්ධ ජනතාවගේ සිත් සතන් ග්‍රහණය කළ බව පෙනේ. ඔහුගේ මෙම සිතුවම් ක්‍රමය විහාරස්ථාන කරා ගමන් කළ බවට සාධක ලැබේ. ඇතැම් විට ඔහුගේ ශෛලිය පාදක කර ගනිමින් වෙනත් සිත්තරුන් විසින් විහාරස්ථාන අලංකාර කළ බව පෙනේ. ඒ අනුව සාර්ලිස් සම්ප්‍රදාය, ශ්‍රී ලංකා චිත්‍ර කලාවට එකතු වූ බව පැහැදිලිය.

## විශ්ලේෂණය

ඉහත විස්තර වලට අනුව නිරීක්ෂණ කළ හැකි කරුණක් වනුයේ ප්‍රාථමික ලෙන් චිත්‍ර, සීගිරි චිත්‍ර සහ කතෝලික චිත්‍ර ආදිය හැරුණු විට ශ්‍රී ලංකාවෙන් ලැබී ඇති සෙසු පැරණි චිත්‍ර සම්පූර්ණයෙන්ම පාහේ බෞද්ධාගමික පසුබිමකින් පෝෂණය වී ඇති බවයි. ශ්‍රී ලාංකීය උරුමය කියාපාන පුරාණ දෘශ්‍ය කලාවේ ප්‍රධානතම බලවේගයක් ලෙස බුදු දහම ක්‍රියාත්මක වී ඇති බව මේ අනුව පැහැදිලි වේ. මෙතෙක් ශ්‍රී ලංකාවෙන් ලැබී ඇති බෞද්ධ චිත්‍ර සාධක මෙසේ හඳුනා ගත හැකිය.

ධාතු ගර්භ චිත්‍ර

වාහල්කඩ චිත්‍ර

ලෙන් චිත්‍ර

ගිරි විහාර චිත්‍ර

ලෙන් විහාර චිත්‍ර

ටැම්පිට විහාර චිත්‍ර

වෙනත් පිළිමගෙවල් ආශ්‍රිත චිත්‍ර (ගෙඩිගෙවල්)

ධර්ම මණ්ඩප ආශ්‍රිත චිත්‍ර

පෙතිකඩ චිත්‍ර

වෙනත් බෞද්ධ චිත්‍ර (සාර්ලිස් චිත්‍ර)

මෙම සියලු කරුණු පාදක කර ගනිමින් කරුණු කිපයක් අනාවරණය කර ගැනිමේ හැකියාව ලැබේ.

1. ලාංකිය චිත්‍රකරණයේ නව කලා සම්ප්‍රදායන් බිහි වීම.
   අනුරාධපුර යුගයේ සිට නූතන යුගය දක්වාම ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ ප්‍රධාන කලා සම්ප්‍රදායන් බුදු දහමෙන් පෝෂණය වී ඇති බව සනාථ වේ.

2. ජගත් කලාවන්ගේ සබඳතාවන් දක්නට ලැබීම.
   ලෝකයේ පුරාණ කලාවන් සහ ඒවා අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලාංකීය බෞද්ධ චිත්‍ර කලාව තුල සුවිශේෂතා රාශියක් හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම ආසියානු කලා සම්ප්‍රදායන්ගේ ආභාසය ශ්‍රී ලාංකීය චිත්‍ර කලාව තුළ හඳුනා ගත හැකි වීම, එකී සම්ප්‍රදායන්ගෙන් පෝෂණය වූ කලා සම්ප්‍රදායන් මෙරට ස්ථාපිත වීම හා ඒවා අපුරු කොටගෙන යම් යම් සහසම්බන්ධතාවන් ගොඩනගා ගැනීමට හැකි වීම ආදී කරුණු මෙහිදී වැදගත් වේ.

3. නව කලා ශෛලීන් බිහි වීම.
   ප්‍රධාන කලා සම්ප්‍රදායන් ලෙස හෝ කේවල වශයෙන් නව චිත්‍ර ශෛලීන් හඳුනා ගැනීමේ හැකියාවක් ලාංකිය චිත්‍ර තුලින් බිහි වී

ඇති බව පැහැදිලිය. නිදර්ශන ලෙස මහනුවර චිත්‍ර කලා සම්ප්‍රදායේ ප්‍රාදේශීය ශෛලීන් හෝ උප ශෛලීන් හඳුනා ගැනීමේ හැකියාව බෞද්ධ චිත්‍ර තුලින් ලැබී ඇති බව පෙනේ.

4. අඛණ්ඩ දෘශ්‍ය ඉතිහාසය ගොඩ නැංවීමට හැකි වීම.
ශ්‍රී ලාංකීය දෘශ්‍ය ඉතිහාසය ගොඩ නැංවීමට ඇති ප්‍රබලතම පැතිකඩක් ලෙස චිත්‍ර සාධක හැඳින්විය හැක. වර්තමානය වනවිට ශේෂව ඇති පුරාණ චිත්‍ර සාධක ඇසුරින් ශ්‍රී ලාංකීය ඉතිහාසයට සමගාමී ඓතිහාසික යුගකරණයක් ගොඩනගා ගැනීමට හැකි වී තිබේ. ඒ අනුරාධපුර යුගයේ චිත්‍ර, පොලොන්නරු යුගයේ චිත්‍ර, මහනුවර යුගයේ චිත්‍ර ආදි වශයෙනි. මෙම හැකියාව ලැබී ඇත්තේ බුදු දහම විෂය වූ බොහෝ ස්ථාන ඇසුරෙනි. ඉහතින් සඳහන් කළ පරිදි සීගිරියේ ප්‍රධාන ගුහා චිත්‍ර මෙම විෂය ක්ෂේත්‍රයට පටහැනිය. සීගිරිය යනු අනුරාධපුර යුගය නියෝජනය වන ප්‍රධානතම ඓතිහාසික දෘශ්‍ය සාධකයකි. එහි ඇති සාම්ප්‍රදායානුගත සුවිශේෂතා සහ ශෛලිය විශේෂත්වයන් අනුරාධපුර යුගයේ චිත්‍ර හඳුනා ගැනීමේ ප්‍රබලතම සාධකයක් බවට පත් වන බව ද නොරහසකි.

5. සුවිශේෂී රාජ්‍ය කාලයන් හා සම්බන්ධ වී තිබීම.
ලාංකීය චිත්‍ර ලැබී ඇති බොහෝ ස්ථාන හා රාජ්‍ය මැදිහත්වීම්, ප්‍රතිසංස්කරණ, අලුත්වැඩියා කිරීම් හෝ නිර්මාණකරණය යන කාර්යයන්ට සම්බන්ධ වීමට ඇති හැකියාව නිසා ශ්‍රී ලාංකීය චිත්‍ර විෂයෙහි සුවිශේෂත්වය මෙන්ම බුදුසමය හා රාජ්‍යත්වය අතර සම්බන්ධතාවන් මනා සේ ප්‍රකට කරයි. 'පොලොන්නරු තිවංක පිළිමගෙ චිත්‍ර. දළදා මාලිගාවේ චිත්‍ර. ලේවැල්ල ගංගාරාමයේ චිත්‍ර' ආදිය නිදසුන් සේ හුවා දැක්විය හැකිය. මහනුවර චිත්‍ර පෝෂණය වීම කෙරෙහි බුදු සමය පසුබිම් වුවද රාජ්‍ය මැදිහත් වීමේ ප්‍රමාණය සුලුපටු නොවන බව ස්ථාන ආශ්‍රිත සන්නස් හා ඓතිහාසික සාධක පිරික්සීමෙන් පැහැදිලි වේ.

6. තාක්ෂණික හා ශිල්පීය පැතිකඩයන් හඳුනා ගැනීමට හැකි වීම.
ශ්‍රී ලාංකීය චිත්‍රකරණයේ විෂය ක්ෂේත්‍රය ඉතා සංකීර්ණ වූවකි. බෞද්ධාගමික පසුතලයක් මත චිත්‍රය නිර්මාණය වීම සඳහා ඇතැම් විට අජන්තා වැනි ස්ථානවල ශිල්පක්‍රමය ශිල්පීන් අධ්‍යයනය කරන්නට ඇති බව පෙනේ. එසේම ටෙම්පරා, ෆ්‍රෙස්කෝ ආදී වශයෙන් ලෝකයේ භාවිතා වන චිත්‍ර තාක්ෂණික ක්‍රමවේද බෞද්ධ සිතුවම් ඇසුරින් හොඳින් හඳුනා ගත හැකිය. බෞද්ධ විහාර ආශ්‍රයෙහි දක්නට ලැබෙන චිත්‍ර තාක්ෂණය සූක්ෂ්ම අධ්‍යයනයන් සඳහා කදිම තෝතැන්නකි. විටෙක ලෙන් විහාර චිත්‍ර තාක්ෂණය තවත් තැනක වෙනස් විය හැකිය. ටැම්පිට විහාර තාක්ෂණය ඊට වඩා සුවිශේෂ විය හැකිය. වරිච්චි බිත්ති ආධාරකයන් මත හුණු පිරියම්න් නිර්මිත චිත්‍ර වල නිමාව රඳවා ගෙන ඇති වරිච්චි තාක්ෂණය පිළිබඳ සඳහන් කළ හැකි දේ බොහෝය. ශ්‍රී ලාංකීය බෞද්ධ චිත්‍ර කලාව නිර්මාණය වීමේ ප්‍රධානතම කරුණක් ලෙස මෙකී ශිල්පක්‍රම අප ගුරු කොට ගත්තා විය හැකිය.

7. කාලීන සමාජ වටපිටාව හඳුනා ගැනීමේ සාධනයක් ලෙස වැදගත් වීම.
කාලීන සමාජ රටාවේ ආවේණික ලක්ෂණයක් වූ සිරිත් විරිත්, සාරධර්ම, මිනිස් සබඳතාවයන්, ආර්ථිකය, පාරිසරික ලක්ෂණ, නීතිමය රාමුව, අධ්‍යාපනය, වාස්තු විද්‍යාව ආදිය පිළිබඳ මනා අධ්‍යයනයක් ශේෂිත බෞද්ධ චිත්‍ර නැරඹීමෙන් පසක් කර ගත හැකි වේ. ඒ නිසා කාලීන සමාජ කැඩපතක් ලෙස මෙම චිත්‍ර ඉතා වැදගත් වේ.

## නිගමන

මේ අනුව පැහැදිලි වන කරුණු කීපයකි. ආසියාතු කලාපීය රටවල් අතුරෙන් බුදු දහමේ ආලෝකය ශ්‍රී ලංකාව සිසාරා දක්නට

ලැබීම ආඩම්බරයකි. ඒ බව ශෛලීන චිත්‍ර, සාධක සපයයි. එපමණක් නොව ශ්‍රී ලංකාවේ සෑම ඉසව්වකම චිත්‍ර වල පැතිරීමක් දක්නට ලැබීම ද බුදුදහමේ බලවේගයක් සේ හඳුන්වා දිය හැකිය. ඒ අනුව පහත සඳහන් අනුමාන කරා ළඟා විය හැකිය.

1. ශ්‍රී ලංකාවේ ඇති චිත්‍ර ස්ථාන හෝ වර්ග ඇසුරෙහි වැඩි ප්‍රතිශතයක් බෞද්ධ මුහුණුවරක් ගැනීම.
2. ඒ සඳහා බුදු දහමේ සෘජු බලපෑම් දක්නට ලැබීම.
3. බුදු සමයෙන් පෝෂණය වූ ධාරක ක්ෂේත්‍රයන් හා සබැඳි චිත්‍ර මෙකී ස්ථාන ඇසුරෙහි ස්ථානගත වීම.
4. පුරාණ දෘශ්‍ය කලාවේ ප්‍රධාන ගමන් මගෙහි ප්‍රභවය හා වර්ධනය පිළිබඳ ප්‍රත්‍යක්ෂ කරගත හැකි වීම.
5. ශ්‍රී ලාංකීය බෞද්ධ චිත්‍ර කලාව පිළිබඳ ඉහත සඳහන් කළ පරිදි පැහැදිලි වර්ගීකරණයක් ගොඩනගා ගත හැකි වීම.
6. ශ්‍රී ලාංකීය උරුම ඉතිහාසය තුළ බුදුසමය වැඩි වැදගත් කමක් දැක්වීම.
7. බුදු සමය කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබීම.

ආදි කරුණු මේ අතර ප්‍රධාන වේ. ශ්‍රී ලංකාවේ ස්ථානීය වශයෙන් ගත් කල චිත්‍ර වර්ග 14ක් මූලිකව හඳුනා ගත හැකි අතර ඉහත සඳහන් කළ පරිදි ප්‍රාථමික චිත්‍ර, පල්ලි චිත්‍ර හා කෝවිල් චිත්‍ර හැර සෙසු සියල්ලම පාහේ බෞද්ධ චිත්‍ර වේ. මේ හැර ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ සමස්තය බොහෝ සෙයින්ම බෞද්ධාගමික ගමන් මගෙහි අඛණ්ඩ සාධක බවට පත්වී ඇති බව නොරහසකි. වාස්තුවිද්‍යා ආකෘති හා ඒ ආශ්‍රිත චිත්‍ර සහිත බොහෝ ස්ථාන මේ සඳහා නිදර්ශන සපයයි.



කරඹගල චිත්‍ර සායක
(Bandaranayake.1986)



හිඳගල ඇතුලුගැබ රහත් රූප
(හෙට්ටිගේ.2009a)



හිඳගල අනුරාධපුර යුගයට අයත් චිත්‍ර සටහනක්
(හෙට්ටිගේ,2009a)



හිඳගල ඇතුළු ගැබ් චිත්‍ර සටහනක්
(හෙට්ටිගේ,2009a)



හිඳගල ඇතුලු ගැබ චිත්‍ර සටහනක්
(හෙට්ටිගේ,2009a)




තිවංක පිළිමගෙයි බිතුසිතුවම් අතර ඇති බුදුරදුන් රන්හිණෙන් සංකස්ස පුරයට වැඩමවීම
(ගොඩකුඹුරේ,1969: රූප සටහන් අංක 8)



තිවංක පිළිමගෙයි බිතුසිතුවම් අතර ඇති පුල්ලපදුම ජාතකය හා මෛත්‍රීබල
ජාතකය
(ගොඩකුඹුරේ,1969: රූප සටහන් අංක 4)

## ආශ්‍රේය ග්‍රන්ථ


01. ගුණසිංහ, සිරි., 1964. 'ලංකාවේ විහාර බිතුසිතුවම්'. **කලා සඟරාව.** කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය.

02. ගොඩකුඹුරේ, චාල්ස්., 1969. **තිවංකපිළිමගෙයි බිතුසිතුවම්.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

03. චුල්ලවග්ග පාළි., 1983. **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.** 5(2). 7 ප්‍රකාශනය. විනය පිටකය - අංක 4. 2 කාණ්ඩය. බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහානායක සහ පණ්ඩිත උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ (පරි.). කොළඹ: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රකාශනය.

04. පරණවිතාන, සෙනරත්., 1964. **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.** පේරාදෙණිය: ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.

05. හෙට්ටිගේ, උදා., 1998a. **දඹව විහාරයේ පෙතිකඩ සිතුවම්.** කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය.

06. හෙට්ටිගේ, උදා., 1998b. **මහනුවර යුගයේ චිත්‍ර සහ එහි සාම්ප්‍රදායික ලක්ෂණ.** දර්ශනපති උපාධි නිබන්ධනය. කැළණිය විශ්වවිද්‍යාලය.

07. හෙට්ටිගේ, උදා., 2009a. **හිඳගල චිත්‍ර.** කොළඹ.

08. හෙට්ටිගේ, උදා., 2009b. 'පොළොන්නරු චිත්‍ර හා සම්ප්‍රදාය', **පුලතිසි වංශය.** කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය.

09. හෙට්ටිගේ, උදා., 2010. **දකුණු ආසියාවේ බෞද්ධ වාස්තුවිද්‍යාව.** ගෝනවල: ප්‍රභාවී.

10. Bandaranayake, Senake., 1986. *The Rock and Wall Paintings of Sri Lanka*. Colombo: Lake House.

11. Joseph, G.E., 1918. *Hindagala Paintings*. Ceylon Administration Paper. Section 4. Colombo: Ceylon Government Press.

12. Lawrie, A.C., 1896. *A Gazetter of Central Province of Ceylon*. Vol: I & II. Colombo: Ceylon Government Press.

13. *Mahāvaüsa*., 1950. (Tr.). Wilhelm Geiger. Colombo: Ceylon Government Information Department.

14. Paranavitana,S., 1959. *University of Ceylon History of Ceylon*. Vol:I. Part I. Colombo.

15. Puri, B.N., 1987. *Buddhism in Central Asia*. Dilhi: Motilal Banarsidass Publishers.

16. *Report of the Archaeological Survey of Ceylon (ASCAR)*., 1951. Colombo: Ceylon Government Press.

17. Smith, V.A., 1911. *History of Fine Arts in India & Ceylon*. Oxford: Clarendon Press.

18. Smither, James. G., 1895. (ed-1993). *Chandra wickramagamage. Architectural Remains Anuradhapura, Sri Lanka.* Colombo: Academy of Sri Lankan Culture.

19. Wijesekara, N., 1959. *Early Sinhalese Paintings.* Maharagama: Saman Press.